# කාර්ය සාධන වාර්තාව

2024 - සිව්වන කාර්තුව

2024

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

# දැක්ම

සුපිලිපන්නබව දිරි ගැන්වෙන සහ යුක්තිය තහවුරු කෙරෙන දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

# මෙහෙවර

නීතිය සවිමත් ව බලාත්මක කිරීම, නිවාරණ යාන්ත්‍රණයන් හා විනිවිදබව සහිත පාලනයක් තුලින් දූෂණය තුරන් කිරීම සහ එමගින් සවිමත් ආර්ථිකයක් ඇති කිරීමට සහය වීම මෙන් ම සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශයේ සම්පත් සුරැකීම


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 01 |
| පැමිණිලි යොමුවීම | 04 |
| විමර්ශන හා වැටලීම් | 06 |
| නඩු පැවරීම | 07 |
| නිවාරණය | 10 |
| මානව හා භෞතික සම්පත් කළමනාකරණය | 11 |

## 01. හැඳින්වීම

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ විධි විධාන අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබ ඇති අතර, පනතේ 3(2) උප වගන්තිය අනුව මෙය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන බව දක්වා ඇත. එමෙන්ම කොමිෂන් සභාවට පනත මගින් පැවරී ඇති බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් මගින් හැර වෙනත් කිසිදු මැදිහත්වීමකට යටත් නොවී ස්වාධීනව කටයුතු සිදුකළ යුතු බව 3(4) උප වගන්තිය මගින් දක්වා ඇත.

### 1.1 කොමිෂන් සභාවේ සංයුතිය

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 4(1) උප වගන්තිය අනුව, නීතිය පිළිබඳ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් සහිත ප්‍රවීණ හා විශිෂ්ඨත්වයට පත්වූ එක් තැනැත්තෙකු හා

I. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම
II. වෝහාරික විගණනය
III. වෝහාරික ගිණුම්කරණය
IV. ඉංජිනේරු විද්‍යාව
V. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍ය තාන්ත්‍රික සේවා
VI. මහජන කටයුතු කළමනාකරණය
VII. රාජ්‍ය පරිපාලනය

යන සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්දක් සහිත තැනැත්තන් දෙදෙනෙකු ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.

ඒ අනුව,

- හිටපු අභියාචනාධිකරණ විනිසුරු හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය මහලේකම් විනිසුරු ඩබ්.එම්.එන්.පී. ඉද්දවල මහතා - සභාපති
- ජ්‍යෙෂ්ඨ බැංකු කරුවෙකු වන මහජන බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කේ.බර්නාඩ් රාජපක්ෂ මහතා - සාමාජික
- හිටපු අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර මහතා - සාමාජික

යන සාමාජිකයින් තිදෙනා 2024 ජනවාරි මස 01 වන දින සිට රාජකාරී ආරම්භ කරන ලදී.

## 1.2 කොමිෂන් සභාවේ කාර්යභාරය


1. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් ලැබෙන ලැමිණිලි සඳහා සාධාරණ විමර්ශන සිදුකිරීම, ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන පැමිණිලි සඳහා නියමිත අධිකරණයන්හි නඩු පැවරීම සහ අධිකරණ වල එම නඩු මෙහෙයවීම.
2. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ මධ්‍යම අධිකාරිය වශයෙන් ක්‍රියා කිරීම.
3. දූෂණය වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා විසින් එළඹ ඇති ජාත්‍යන්තර සම්මුති, ගිවිසුම් සහ බැඳීම් ක්‍රියාත්මක කිරීම.
4. දූෂිත ක්‍රියා පිළිබඳව මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම.
5. දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
6. දූෂණ ක්‍රියා අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල නීති, පරිචයන් සහ කාර්ය පටිපාටි පරීක්ෂා කිරීම.
7. දූෂණය තුරන් කිරීම සඳහා රාජ්‍ය හෝ පුද්ගලික ආයතන වෙත මගපෙන්වීම සහ නියෝග ලබාදීම.
8. දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීම.
9. කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා නියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම් සහ විනය පාලනය සම්බන්ධ කටයුතු

## 1.3 2024 ජනවාරි මස 01 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

1954 අංක 11 දරණ අල්ලස් පනත මගින් ස්ථාපනය කරන ලද අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව අහෝසි කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 1994 අංක 19 දරණ පනත යටතේ පිහිටවූ අතර එය 1994 දෙසැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත යටතේ අල්ලස හා දූෂණය මැඩලීම සම්බන්ධව කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කරන ලද අතර, 2024 ජනවාරි මස 01 වන දින සිට නව සාමාජිකයින් යටතේ කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ.

## 1.4 කොමිෂන් සභාවේ ව්‍යූහය

වර්තමානය වන විට කොමිෂන් සභාවේ කටයුතු සිදුවන සංවිධාන ව්‍යූහය පහත පරිදි වන අතර, දූෂණ විරෝධී පනත මඟින් පෙර පැවැති පනත් වලට අමතරව පැවරුණු රාජකාරි හා වගකීම් ඉටුකිරීමට අදාලව කොමිෂන් සභාව ප්‍රතිසංවිධානය සිදුකරනු ලබන අතර, එම කටයුතු වලින් අනතුරුව කොමිෂන් සභාවේ ව්‍යූහය සංශෝධනය වීමට නියමිතය.



## 02. පැමිණිලි යොමුවීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් වන පැමිණිලි පහත ක්‍රම මගින් යොමු කිරීමට හැකියාව ඇත.

- 1954 දුරකතන අංකයට ඇමතීම මගින්
- Fax පණිවිඩ මගින්
- විද්‍යුත් තැපැල මගින්
- අතින් ගෙනැවිත් භාරදීමෙන්
- කාර්යාලීය ලිපිනයට නාමිකව හෝ නිර්නාමිකව යොමුකරන ලිපි මගින්


2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත සම්මත වීමෙන් පසු ජනතාව අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් දක්වන උනන්දුව වැඩිවීම හා දූෂණ නිවාරණ ඒකකය මගින් රටපුරා පවත්වනු ලබන වැඩසටහන් තුළින් ප්‍රජාවගේ දැනුවත්භාවය ඉහළ යාම හේතුවෙන්, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් පෙර වර්ෂ වලදී ලද පැමිණිලි වලට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ලද පැමිණිලි වල වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමුවන පැමිණිලි, කොමිෂන් සභාවේ ලේකම් අංශය මගින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන අතර, එහිදී අල්ලස් පනතට අදාල නොවන හා ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවන පැමිණිලි විමර්ශනය සඳහා භාජනය නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරනු ලබයි. 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලද පැමිණිලි හා ඉන් විමර්ශනයට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාවන් පහත පරිදි වේ.

ලද පැමිණිලි හා විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 2014 - 2024

| වර්ෂය | ලද පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව ** |
|---|---|---|
| 2014 | 2,345 | 863 |
| 2015 | 3,964 | 1,823 |
| 2016 | 3,450 | 2,435 |
| 2017 | 2,768 | 1,573 |
| 2018 | 3,465 | 2,086 |
| 2019 | 3,305 | 2,020 |
| 2020 | 2,764 | 1,909 |
| 2021 | 2,335 | 892 |
| 2022 | 2,512 | 921 |
| 2023 | 3,431 | 1,152 |
| 2024 | 4,267 | 1,105 |

** වැටලීම් සඳහා ලද පැමිණිලි හැර




විමර්ශනය කිරීමට නියෝග කරනු ලබන පැමිණිලි කොමිෂන් සභාවේ විමර්ශන අංශයට යොමුකරනු ලබන අතර, වෙනත් ආයතන වලින් වාර්තා කැඳවීමට හා විමර්ශන ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීමට නීති වාර්තා කැඳවීම අවශ්‍ය වන පැමිණිලි සම්බන්ධව අදාළ කටයුතු කොමිෂන් සභාවේ ලේකම් අංශය මගින් සිදුකරනු ලැබේ.

**කොමිෂන් සභාව සමග සම්බන්ද විය හැකි ආකාරය**

ක්ෂණික ඇමතුම් : 1954

විද්‍යුත් ලිපිනය : ciaboc_gen@ciaboc.gov.lk

ෆැක්ස් : 0112596360

ලිපිනය : 36, මලලසේකර මාවත, කොළඹ 07

කොමිෂන් සභාව වෙත පුද්ගලිකව පැමිණීමෙන්ද, පැමිණිලි කළ හැක

## 03. විමර්ශන සහ වැටලීම්

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධ විමර්ශන කටයුතු කොමිෂන් සභාවේ විමර්ශන අංශය මගින් සිදුකරනු ලැබේ. පනතේ 42 වගන්තිය ප්‍රකාරව,

- යම් තොරතුරක් ලැබීමෙන් පසුව
- පැමිණිල්ලක් ලැබීමෙන් පසුව
- කොමිෂන් සභාවේ අවශ්‍යතාවය අනුව හෝ
- කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් වැදගත් දෙයක් මත පදනම්ව

මූලික පරීක්ෂණයක් ආරම්භ කළ හැකි වේ. එහිදී පනතේ 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, විමර්ශනයක් පැවැත්වීමට තීරණය කළ හැක. එසේ වුවද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් මූලික පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව විමර්ශනයක් පැවැත්වීමට ද කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

### 3.1 විමර්ශන කටයුතු

කොමිෂන් සභාව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලැබුණු පැමිණිලි අතුරින් විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 1,105 කට අදාළ ගොනු වල විමර්ශන කටයුතු විමර්ශන අංශය මගින් ආරම්භ කර සිදුකළ අතර, මීට පෙර කාලසීමාවන්හි ලැබුණු ගොනු ද ඇතුළුව 2024.12.31 දින වන විට විමර්ශන ගොනු 2,361 කට අදාළ විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.

### 3.2 වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්

අල්ලස් ලබාගැනීමේ හෝ ලබාදීමේ සිදුවීම් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු සහ පැමිණිලිකරුගේ සහයෝගය ලැබෙන අවස්ථාවන්හිදී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අදාල වරද සිදුවන අවස්ථාවේදී වැටලීමක් සිදුකර අත්අඩංගුවට ගැනීම් සිදුකෙරේ. 2024 වර්ෂය තුළ එවැනි වැටලීම් 116ක් සිදුකරන ලද අතර, ඉන් 53 ක් ඵලදායි විය. වැටලීම් වලදී සැකකරුවන් 86 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට හැකි විය.

### 3.3 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සිදුකරන ලද වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්


| වර්ෂය | සිදුකරන ලද ඵලදායී වැටලීම් සංඛ්‍යාව | වැටලීම් වලදී අත්අඩංගුවට ගත් සංඛ්‍යාව |
|---|---|---|
| **2020** | 38 | 45 |
| **2021** | 33 | 36 |
| **2022** | 32 | 36 |
| **2023** | 43 | 57 |
| **2024** | 53 | 86 |

## 04. නඩු පැවරීම්

විමර්ශන කටයුතු නිමකර නඩු පැවරීමට කරුණු පවතින ගොනු වලට අදාලව නඩු පැවරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ කොමිෂන් සභාවේ නීති අංශය මගිනි. ඒ අනුව 2024 වර්ෂය තුළ නඩු 83 ක් පවරා ඇති අතර අදාල කාලය තුල අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 69 කි.


### 4.1 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පවරන ලද නඩු පිළිබඳ තොරතුරු

| වර්ෂය | අල්ලස් නඩු | දූෂණ නඩු | අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු | වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු | එකතුව |
|---|---|---|---|---|---|
| 2020 | 47 | 01 | 02 | -- | 50 |
| 2021 | 58 | 02 | -- | 02 | 62 |
| 2022 | 62 | 26 | -- | 01 | 89 |
| 2023 | 55 | 03 | 02 | -- | 60 |
| 2024 | 70 | 10 | 03 | | 83 |



## 4.2 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු

| | අල්ලස් නඩු | දූෂණ නඩු | අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු | වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු | එකතුව |
|---|---|---|---|---|---|
| 2020 | 52 | | 03 | -- | 55 |
| 2021 | 62 | | 05 | 02 | 69 |
| 2022 | 90 | | -- | 07 | 97 |
| 2023 | 58 | 10 | 01 | -- | 69 |
| 2024 | 62 | 07 | -- | -- | 69 |




## 4.3 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පවරණ ලද නඩු සංඛ්‍යාව, අවසන් කරන ලද නඩු සංඛ්‍යාව සහ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව

| වර්ෂය | පවරන ලද නඩු | | | අවසන් කරන ලද නඩු | | | විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | මහාධිකරණය | මහේස්ත්‍රාත් අධිකරණය | එකතුව | මහාධිකරණය | මහේස්ත්‍රාත් අධිකරණය | එකතුව | |
| 2015 | 76 | 32 | 108 | 41 | 11 | 52 | 15 |
| 2016 | 43 | 44 | 87 | 26 | 08 | 34 | 15 |
| 2017 | 41 | 32 | 73 | 68 | 20 | 88 | 57 |
| 2018 | 36 | 16 | 52 | 84 | 26 | 110 | 64 |
| 2019 | 37 | 09 | 46 | 75 | 19 | 94 | 54 |
| 2020 | 42 | 08 | 50 | 46 | 09 | 55 | 28 |
| 2021 | 57 | 05 | 62 | 43 | 26 | 69 | 09 |
| 2022 | 77 | 12 | 89 | 64 | 32 | 96 | 22 |
| 2023 | 56 | 04 | 60 | 60 | 09 | 69 | 19 |
| 2024 | 79 | 04 | 83 | 56 | 13 | 69 | 30 |

## 4.4 2024.01.01 – 2024.12.31 දින දක්වා නඩු තීන්දු මගින් විත්තිකරුවන් වරදකරුවන් බවට පත්වූ අය පිළිබඳ විස්තර

| අනු අංකය | ආයතනය | වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර | වරදකරුවන් වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - සබරගමුව | ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | 1 |
| 2 | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | ධාවන කළමනාකරු | 1 |
| 3 | | සිවිල් පුරවැසියන් | 10 |
| 4 | ලංකා විදුලිබල මණ්ඩලය | කාර්යාල කාර්යය සහායක | 1 |
| 5 | පොලිස් දෙපාර්තමේන්තුව | පොලිස් සැරයන් | 4 |
| | | පොලිස් කොස්තාපල් | 2 |
| 6 | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය- අත්තනගල්ල | ආරක්ෂක නිලධාරී | 1 |
| 7 | නවගම්පුර වසම | ග්‍රාම නිලධාරී | 1 |
| | ඩයගම ග්‍රාම නිලධාරී | | 1 |
| | පල්ලේගම- ග්‍රාම නිලධාරී | | 1 |
| 8 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | හිටපු ආපදා කළමනාකරණ අමාත්‍ය | 1 |
| 9 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | අධීක්ෂණ කළමනාකරු | 1 |
| | | දුම්රිය පනිට්ටුකරු | 1 |
| 10 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | සහකාර රේගු අධිකාරී | 1 |
| | | රේගු අධිකාරී | 3 |
| **එකතුව** | | | **30** |

## 4.5 විභාග වෙමින් පවතින නඩු

**2024 දෙසැම්බර් මස 31 දින වනවිට අධිකරණවල නඩු 259ක් විභාග වෙමින් පවතී. ඒ පහත පරිදිය.**

මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 26
මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 231
ත්‍රිපුද්ගල මහධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 02

## 05. නිවාරණය

අල්ලස හා දූෂණයෙහි අනිසි ප්‍රතිවිපාකයන් සහ අල්ලස හා දූෂණයට එරෙහිවීම මෙන්ම වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, අධ්‍යාපන ක්ෂේත්‍රය හා මහජනතාව ඉලක්ක කරගනිමින් දීප ව්‍යාප්තව දූෂණ නිවාරණ වැඩ සටහන් පැවැත්වීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

### 5.1 2024.01.01 - 2024.12.31 දක්වා පවත්වන ලද දූෂණ නිවාරණ වැඩ සටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

| වැඩ සටහන් පැවැත්වූ ආයතනය | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා | 72 |
| අර්ධ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා | 45 |
| පුද්ගලික ආයතන වල නිලධාරීන් සඳහා | 11 |
| වෙනත් පාර්ශවයන්/ පුද්ගලයන් සඳහා | 2 |
| ජනමාධ්‍ය මගින් පවත්වන ලද වැඩ සටහන් | 9 |
| මුළු වැඩසටහන් සංඛ්‍යාව | **139** |

### 5.2 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රහය මත JURE ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද නිවාරණ වැඩසටහන් පිළිබඳ සාරාංශය - 2024

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|
| 01 | සුපිළිපන්න නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් | 4 | 3,233,021.42 |
| 02 | රාජ්‍ය ආයතන තුළ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා වන තෙදින නේවාසික පුහුණු වැඩසටහන් | 4 | 11,303,744.31 |
| 03 | දූෂණ සහ වංචා සිදුවීමට අවදානමක් ඇතැයි හඳුනාගත් රාජ්‍ය ආයතන | 5 | 1,589,876.50 |
| 04 | ප්‍රජා පොලිස් නිළධාරීන් දැනුවත් කිරීමේ/පුහුණු කිරීමේ වැඩසටහන් හා රැකියා පුහුණු වැඩසටහන් | 11 | 6,723,418.50 |
| 05 | අධ්‍යාපන අංශය සඳහා සුපිළිපන්නභාවය, දූෂණ විරෝධී සහ අගයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | 3 | 1,876,747.53 |
| 06 | ව්‍යවස්ථාපිත මණ්ඩල නිළධාරීන් සඳහා දැනුවත් කිරීමේ/ පුහුණු කිරීමේ වැඩසටහන් හා පුහුණු අවස්ථාවන් | 1 | 407,700.00 |
| 07 | අත්දැකීම් හුවමාරු කරගැනීමේ සැසිය සහ සංවාද අරමුණු අතර හොඳම පරිචයන් හුවමාරු කරගැනීම සහ අත්දැකීම් බෙදාගැනීමේ සැසිය සහ සංවාදය | - | - |
| 08 | සිවිල් සමාජය සමඟ දූෂණ විරෝධී සහ සම්බන්ධිත අත්දැකීම් සහ හොඳම භාවිතයන් හුවමාරු කර ගැනීම සඳහා කාර්තුමය සැසි පැවැත්වීම. | 2 | 407,905.00 |

මේ අනුව JURE ව්‍යාපෘතිය යටතේ බාහිර පුද්ගලයන්/නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් 2024 තුළ පවත්වන ලදි. මීට අමතරව කොමිෂන් සභාවේ නීති නිළධාරීන්, විමර්ශන නිළධාරීන් හා නිවාරණ නිළධාරීන් ඇතුළු අනෙකුත් නිළධාරීන් සඳහා එම ව්‍යාපතිය යටතේ වැඩසටහන් 06 ක් 2024 වර්ෂය තුළදී පවත්වන ලදි.

## 06. මානව හා භෞතික සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකිරීමෙහිලා අවශ්‍ය භෞතික හා මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය පාලන අංශය සහ මුදල් අංශය මගින් සිදුකෙරේ. එම කටයුතු වල ප්‍රගතිය පහත පරිදි වේ.

### 6.1 මානව සම්පත් සංවර්ධනය - දේශීය පුහුණු කටයුතු (2024.09.30 – 2024.12.31 දක්වා කාල සීමාවට/ 2024 සිව්වන කාර්තුවට අදාළව)

| අනු අංකය | පුහුණු වැඩ මුළුව | සහභාගී වූ නිළධාරීන්ගේ විස්තර | | වියදම (රු) |
|---|---|---|---|---|
| | | තනතුර | සංඛ්‍යාව | |
| 01 | වැටුප් පරිවර්ථන වැඩමුළුව | කළමනාකරණ රස්වා නිලධාරී | 1 | Rs.13,000.00 |
| 02 | ග්‍රැෆික් නිර්මාණකරනය - IV | දූෂණ නිවාරණ නිළධාරී | 1 | Rs.45,000.00 |
| 03 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස කාර අධයක්ෂ (නීති) තනතුරට බඳවාගත් නිළධාරීන් සඳහා පැවැත්වෙන වැඩමුළුව | සහකාර අධයක්ෂ (නීති) | 16 | Rs.28,000.00 |
| 04 | නීති නිළධාරීන් සඳහා වන නේවාසික තෙදින වැඩුළුව | සහකාර අධ්‍යක්ෂ (නීති) | 16 | Rs.24,000.00 (දේශන ගාස්තු) |
| 05 | බදු නීතිය ස ආදායේ බදු වගකීම ගණනය කිරීම පිළිබඳ වගකීම | කළමනාකරණ රස්වා නිලධාරී | 1 | Rs.13,500.00 |
| 06 | රියැදුරන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහන | රියැදුරු නිළධාරී | 27 | Rs.3,350.00 (දේශන ගාස්තු) Rs.35,533.00 |
| 07 | කොමිෂන් සභාවේ ප්‍රාථමික හා ද්විතියික මට්ටමේ නිළධාරීන්ගේ ආකල්ප හා හැකියාවන් වර්ධනය | නීති සහකාර | 2 | Rs.140,146.00 Rs.6,000.00 (දේශන ගාස්තු) |
| | | පුස්ථකාලයාධිපති | 1 | |
| | | අයවැය සහකාර | 1 | |
| | | දූෂණ නිවාරණ නිළධාරී | 5 | |
| | | සංවර්ධන නිළධාරීන් | 8 | |
| | | තොරතුරු තාක්ෂණ සහකාර | 2 | |
| | | කළමනාකරණ රස්වා නිලධාරී | 21 | |
| | | යුතුරු ලේඛක | 4 | |
| | | ලඝු ලේඛක | 1 | |
| | | කාර්යාල කාර්ය සහායක | 23 | |
| | | රියැදුරු | 6 | |
| 08 | රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | කළමනාකරණ රස්වා නිලධාරී | 2 | Rs.150,000.00 |

**6.2 මානව සම්පත් සංවර්ධනය - විදේශීය පුහුණු පාඨමාලාවන් (2024.09.30 – 2024.12.31 දක්වා කාල සීමාවට/2024 සිව්වන කාර්තුවට අදාළව)**

| අනු අංකය | සම්මන්ත්‍රණය/වැඩමුළුව | පැවැත්වූ රට | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන්ගේ තොරතුරු | |
|---|---|---|---|---|---|
| | | | | තනතුර | සංඛ්‍යාව |
| 01 | Criminal Justice Response to Corruption | ජපානය | 20.10.2024 - 21.11.2024 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| 02 | Workshop on the effective implementation of recommendations emanating from the country reviews in the framework of the mechanism for the review of implementation of the United Nations Convention Against Corruption (UNCAC) | රුසියාව-මොස්කව් | 08.10.2024 - 10.10.2024 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| 03 | Second resume fifteenth session of the implementation review group | ඔස්ට්‍රියා - වියානා | 04.11.2024 - 08.11.2024 | කොමසාරිස් – III | 1 |
| | | | | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| 04 | Participation in the joint meeting of Yeman in the second review cycle of the Mechanism for the review of Implementation of the United Nations convention against Corruption | ඔස්ට්‍රියාව - වියානා | 11.11.2024 - 13.11.2024 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 1 |
| 05 | International Expert meeting on Asset Return and Sustainable Development | ඉතියෝපියාව | 11.12.2024 - 13.12.2024 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 1 |

## 6.3 2024.12.31 දින වන විට මූල්‍ය ප්‍රගතිය

| Expenditure Subject No. | Finance Code | Category/Object/Item Description | Budgetary Allocation 2024 | Expenditure as at 31-12-2024 |
|---|---|---|---|---|
| 010-1-1-0-1001 | 11 | Salaries and Wages | 223,000,000.00 | 207,229,709.32 |
| 010-1-1-0-1001 | 21 | Salaries and Wages | 16,800,000.00 | 16,800,000.00 |
| 010-1-1-0-1002 | 11 | Overtime and Holiday Payments | 7,560,000.00 | 6,906,002.80 |
| 010-1-1-0-1003 | 11 | Other Allowances | 321,300,000.00 | 320,906,688.23 |
| 010-1-1-0-1101 | 11 | Travelling Expenses - Domestic | 5,000,000.00 | 4,958,231.73 |
| 010-1-1-0-1102 | 11 | Travelling Expenses - Foreign | 11,950,000.00 | 10,322,132.87 |
| 010-1-1-0-1201 | 11 | Stationary and Office Requisites | 18,080,000.00 | 13,878,230.44 |
| 010-1-1-0-1202(002) | 11 | Fuel Allowance | 12,000,000.00 | 12,000,000.00 |
| 010-1-1-0-1202(009) | 11 | Fuel for Pool Vehicles | 28,864,000.00 | 12,053,357.89 |
| 010-1-1-0-1202(010) | 11 | Fuel for Other Purposes | 100,000.00 | 62,903.64 |
| 010-1-1-0-1203(002) | 11 | Uniforms | 200,000.00 | 156,000.00 |
| 010-1-1-0-1301 | 11 | Vehicles | 29,500,000.00 | 29,448,459.24 |
| 010-1-1-0-1302 | 11 | Plant and Machinery | 9,000,000.00 | 5,651,753.30 |
| 010-1-1-0-1303 | 11 | Building and Stuctures | 5,000,000.00 | 722,688.85 |
| 010-1-1-0-1304 | 11 | Software Maintenance | 2,000,000.00 | 1,432,950.00 |
| 010-1-1-0-1401 | 11 | Transport | 3,600,000.00 | 2,147,284.94 |
| 010-1-1-0-1402 | 11 | Postal and Communication | 9,600,000.00 | 7,503,502.59 |
| 010-1-1-0-1403 | 11 | Electricity and Water | 34,000,000.00 | 21,592,009.43 |
| 010-1-1-0-1404 | 11 | Rent and Local Taxes | 32,080,000.00 | 1,724,801.40 |
| 010-1-1-0-1405 | 11 | Cleaning and Janitorial Services | 12,000,000.00 | 11,117,663.12 |
| 010-1-1-0-1407 | 11 | Security Services | 5,500,000.00 | 3,566,700.00 |
| 010-1-1-0-1408 | 11 | Lease Rental for Vehicles procured Under Operatonal Leasing Other | 21,100,000.00 | 17,663,496.58 |
| 010-1-1-0-1409(138) | 11 | Machinery and Office Equipment<br>Service Agreements | 9,500,000.00 | 2,406,502.26 |
| 010-1-1-0-1409(139) | 11 | Vehicle Insurance | 2,000,000.00 | 924,800.52 |
| 010-1-1-0-1409(140) | 11 | Miscellaneous Services Expenditure | 3,500,000.00 | 3,486,269.15 |
| 010-1-1-0-1505 | 11 | Subscriptions and Contributions Fee | 2,050,000.00 | 0.00 |
| 010-1-1-0-1506 | 11 | Property Loan Interest to Public Servants | 1,200,000.00 | 792,234.08 |
| 010-1-1-0-1701 | 11 | Losses and Write Off | 36,000.00 | 35,500.00 |
| 010-1-1-0-2001 | 11 | Buildings and Stuctures | 30,000,000.00 | 22,127,701.84 |
| 010-1-1-0-2003 | 11 | Vehicles | 1,000,000.00 | 868,807.14 |
| 010-1-1-0-2102 | 11 | Plant, Machinery and Equipment | 3,920,000.00 | 3,184,598.87 |
| 010-1-1-0-2103 | 11 | Furniture and Office Equipment | 12,000,000.00 | 10,593,694.39 |
| 010-1-1-0-2401 | 11 | Staff Training | 2,900,000.00 | 1,047,998.08 |

| | | | | |
|---|---|---|---|---|
| 010-1-1-3-2509 | 11 | Bribery and Corruption Awarenees Programme for the Public (Other) | 13,750,000.00 | 1,472,163.62 |
| 010-1-1-4-2509 | 13 | EU - Sri Lanka Justice Reform Programme - JURE (UNDP) - Other | 35,350,000.00 | 35,303,631.84 |
| 010-1-1-5-2509 | 11 | Facilitation of implementing Anti-<br>Corruption Act | 25,000,000.00 | 24,373,324.80 |
| **Recurrent Total** | | | **826,520,000.00** | **715,489,872.38** |
| **Capital Total** | | | **123,920,000.00** | **98,971,920.58** |
| **Grand Total** | | | **950,440,000.00** | **814,461,792.96** |

## 6.4 2024.09.30 දිනට සාරාංශගත මූල්‍ය ප්‍රගතිය

| | **අයවැය ප්‍රතිපාදනය - 2024** | **2024.12.31 දිනට වියදම** |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 826,520,000.00 | 715,489,872.38 |
| ප්‍රාග්ධන වියදම | 123,920,000.00 | 98,971,920.58 |
| එකතුව | **950,440,000.00** | **814,461,792.96** |

## 6.5 කාර්ය මණ්ඩල විස්තර

**2024.12.31 දිනට සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු**

| | අනුමත සේවක සංඛ්‍යාව | අනුයුක්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 63 | 42 |
| තෘතීයික | 218 | 07 |
| ද්විතීයික | 242 | 110 |
| ප්‍රාථමික | 126 | 84 |
| **එකතුව** | 649 | 243 |
| ශ්‍රී ලංකා පොලීසිය විසින් කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරන විමර්ශන නිළධාරීන් | 283 | 219 |
| මුළු එකතුව | 932 | 462 |